7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# සංස්කෘතික විසරණය නූතන ලාංකේය කාපිරි ජනතාවගේ සංස්කෘතික වෙනස් වීම කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (සිරම්බිඅඩි ප්‍රදේශය ඇසුරෙන්)

අභයසුන්දර පී.එන්.[1], අමරකෝන් ඒ.ඒ.සී.එන්.[1*], විතානගේ ඩබ්ලිව්.කේ.එම්.[1,3], දිසානායක ඩී.එම්.කේ.ජී.කේ.[2] සහ ශ්‍රී ශාන් ජී.ඒ.ඒ.එන්.[1]

[1]මානව විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
chathurungani@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් යනුවෙන් ප්‍රධාන ජනවර්ග හතරක් දැකිය හැකි අතර සුළු ජන කොට්ඨාස කිහිපයක් ද වර්තමානය වන විට ලංකාවෙහි නිත්‍ය සාමාජිකයින් බවට පත් වී අවසන් ය. යටත් විජිත සමයන්හි දී යටත් විජිත පාලකයන්ගේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා විවිධ ජන වර්ගයන් මෙරටට රැගෙන එන ලදි. ඒ අනුව 1505 දී පමණ පෘතුගීසීන් විසින් යුධ භටයන් හා වහලුන් ලෙස මෙහි රැගෙන ආ අප්‍රිකානු ජනයා ලාංකේය කාපිරි ජනයාගේ ආදි මුතුන්මිත්තන් බව සැලකේ. පෘතුගීසී පාලන සමයේ පමණක් නොව ලන්දේසීන් හා ඉංග්‍රීසීන් යටතේ ද අනුග්‍රහය ලද ඔවුහු විවිධ වෘත්තීන්හි නිරත වෙමින් දිවයිනේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත වූහ. අද වන විට මෙම ජනයාගේ විශේෂතා හා අනන්‍යතා සියල්ල සංස්කෘතික විසරණය හේතුවෙන් වියැකී යමින් පවතී. ඒ අනුව සංස්කෘතික විසරණය යනුවෙන් අප හඳුනාගනුයේ විවිධ හේතු නිසා සමාජ දෙකක සාමාජිකයන් අතර ඇතිවෙන අන්තර් සම්බන්ධතා අවස්ථාවල දී එක් සමාජයක පවතින සංස්කෘතිකාංග අනෙක් සමාජයේ සාමාජිකයින් විසින් තම සංස්කෘතිය වෙත ඇද ගැනීම යි. එලෙස නූතන ලාංකේය කාපිරි ජනතාවගේ සංස්කෘතික වෙනස්වීම කෙරෙහි සංස්කෘතික විසරණය බලපෑ ආකාරය අධ්‍යයනයට වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ සිරම්බිඅඩි ප්‍රදේශය යොදා ගැනුණි. ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය යොදා ගත් අතර එහි දී අහඹු ලෙස තෝරා ගත් කාපිරි පුද්ගලයින් 50 දෙනෙකු දත්තදායකයින් ලෙස යොදා ගන්නා ලදි. අද වන විට ලාංකේය කාපිරි ජනයාගේ අනන්‍යතාවයන් ඔවුන් තුළින් ගිලිහී යමින් පවතින අතර නුහුරු සංස්කෘතියකට අනුගත වීමට ද සිදු වී ඇත. කෙසේ නමුත් ලාංකේය කාපිරි ජනතාවට අන්‍ය වූ වටිනා මෙන් ම විචිත්‍රවත් සංස්කෘතික උරුමයක් පැවත තිබුණ ද වත්මනෙහි බොහෝ අවස්ථාවන්හි දී ඔවුන්ගේ රූපානුදර්ශයේ ඇති වෙනස්කම් මත ඔවුන් හඳුනාගත හැකි වුව ද සංස්කෘතිකමය වශයෙන් මොවුන් සිංහල සහ දෙමළ මහා සමාජයන්ට බොහෝ සමානකම් පෙන්නුම් කරයි. ඒ අනුව මෙලෙස සංස්කෘතික විසරණය හේතුවෙන් කාපිරි ජනයාට ම ආවේණික ව පැවතියා වූ සංස්කෘතිකාංග අනෙකුත් ජන කණ්ඩායම්වල සංස්කෘතිකාංග සමඟ මිශ්‍ර වීමත් ඇතැම් සංස්කෘතිකාංග සදහට ම තුරන් වීමත් හඳුනාගත හැකි ය.

***ප්‍රමුඛ පද:*** කාපිරි ජනතාව, සංස්කෘතිය, සංස්කෘතික විසරණය, පෘතුගීසීන්